නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 13 - 27

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# මාතෘකාවක් ලැබුණු රචනාවක්

අන්තිමට කලියෙන් කාලච්ඡේදෙට බැල් එක අදිනකොටයි මම දැක්කෙ පියුම් මාමගෙ බයිසිකලේ ඉස්කොලෙ පැත්තට හරවනවා. කම්බි දැල් අස්සෙන් මම ඒ දිහා එක සීරුවට බලාන උන්නා.

"මොනවද බලන්නේ."

මාව ගැස්සිල හිටියා.

"අර"

පියුම් මාමා, මුර සීයා අතට ලියුම් මිටියක් දික් කරා. සීයා මහපට ඇඟිල්ල තියලා ලියුම් ටික අතට ගත්තා.

"කසුන්ගෙ ලියුමත් ඇවිත් ද දන්නෑ."

මම සඳුන්ට උත්තරයක් නොදී මුර සීයා ලොකු සර්ගෙ ඔපිස් කාමරේ දිහාට යනවා උගුඩුවෙක් ගාණට බලාන උන්නා. කලාප කාර්යාලයෙන් ලියුම ආපු වෙලේට වඩා මේ පාර මයෙ හිත ගැහෙනව වැඩි ද මන්දා. මම හෙමින් සැරේ නළල පිස්සා. දාඩියෙන් බත් වෙලා. උගුර කට වේළිලා තිබුණ නිසා පල්ලට කෙළ ගිලුණෙත් නෑ.

ඒත් එක්ක ම ඉංගිරිසි මිස් පන්තියට ආවෙ වෙනද වගේ ම පොත් මිටිය උඩින් කහබිලිය කෝට්ටුව තියාගෙන. කෝට්ටුව ගෙනාවට මොකෝ මිස් හරි හොඳා. ගණන් සර්ට වඩා නම් ගහනවත් අඩු යි. ඉවසල ඉවසල බැරි ම තැන පාරක් ගැහුවොත් ඇරෙන්ඩ මිස් කෝට්ටුව ගේන්නෙ මිස්ගෙ අත පාළුවට මයෙ හිතේ. ඒ මොනාව වුණත් අපෙ එවුන් මිස්ට හරි මනාප යි. මාත් මිස්ට හරි ආදරෙයි. නදීකා මිස් කොයි කාටත් එක යි.

මිස් ඇවිත් විනාඩි දහයක් පහළොවක් විතර උගන්නන්ඩ ගත්තා. ඒත් ඒ කිසි දෙයක් මගෙ ඔළුවට ගියේ නෑ. හිත තිබ්බෙ ම පියුම් මාම ගෙනාපු ලියුම් මිටියෙ. මිස් බෝඩ් ලෑල්ල පැත්තට හැරිලා ලියන හැම වෙලාවෙ ම මම බැලුවෙ ඔපිස් කාමරේ දිහා. ටික වෙලාවක් ගියාට පස්සෙ සිංහල සර් අපෙ පන්තිය දිහාවට ආවා. මට ඉස්පාසුවක් නෑ. සර් එන්නෙ මාව හොයාගෙන ද?

"නදීකා මිස්, අශේන්ව පොඩ්ඩක්."

"ආ.... හරි සර්."

"අශේන්"

අශේන් ඩැස් එක අස්සෙන් කොළ වගයක් අරගෙන, නැඟිටලා පංකජ සර් එක්ක ඔපිස් කාමරේ දිහාවට යන්ඩ ගියා. යන ගමනුත් කොළවල තිබ්බ ඒවා සර්ට පෙන්න පෙන්න අශේන් බර කතාවක.

"සර් ඇයි මට කතා නොකළෙ" හුඟ වෙලාවක් මම ඒ ගැන කල්පනා කර කර හිටියා. බෝඩ් ලෑල්ලේ දාපු සමහර ඒවා ආයෙ ම ලියාගන්ඩ වුණේ සඳුන්ගෙ පොතට එබිලා. වෙනදට නම් එහෙම කරන්නෙ සඳුන්.

සමහර විට මම පරාද ඇති. නැත්තම් පංකජ සර් පන්තියට ආපු වෙලේ මට කතා කරන්ඩ තිබුණානෙ. එහෙමත් නැත්තන් තව ම කලාප කාර්යාලයෙන් ලියුම තැපැල් කරල නැති ව ද දන්නෑ, පියුම් මාමට මගෙ ලියුම මග ඇරිල එහෙමවත් ද, වෙලාවකට මාමටත් සිහි නැනෙ. මල්ලෙ තිබිල එහෙ මෙහෙ වුණාවත් ද දන්නෑ. සමහර විට මුර සීයා වට්ටගෙන ද. නෑ, නෑ එහෙම වෙන්ඩ බෑ. සීයා ඔපිස් කාමරේට යනකම් ම මං ඇහැපිල්ලමක්වත් නොගහනෙ උන්නේ. ලියුමක් වැටෙනවා නම් දැක්කේ නෑ. ලොකු සර්ට තව ම ලියුම් බලන්ඩ බැරි වුණාවත් ද? හැබැයි වෙනදට නම් ලියුම් මල්ල ආපු ගමන් ලොකු සර් අනිත් වැඩත් පැත්තක දාලා කරන්නෙ ලියුම් මල්ල ලිහන එකනෙ. අනේ මන්ද මාත් හිතන දේවල්.

කමක් නෑ පරාද වුණත් මොකෝ. දින්නත් අනික මහ වාතෙ. හවහට සඳුන්ල එක්ක ලන්දෙ උඩහ බෝල සෙල්ලම් කරන් නැතුව ඉස්කෝලෙ නැවතිල පංකජ සර්ගෙන් බැණුම් අහගන්ඩත් ඕනෙනෙ. ආබාධාත වරද්දපුව ම සර්ට යක්ෂාවේශ වෙනවා. හනිකට දුම්මල වරම සර්ගෙ අතේ. ඒකත් හොඳයි එහෙනම්. ඒකෙනුත් නිදහස්.

මුර සීයා ඊළඟ පීරියඩ් එකට බෑල් එක අදින්ඩ ඔරලෝසුව ඇස් ළඟට කිට්ටු කරල කණුව දිහාට ගියා. එතකොට ම තමයි අශේන් ඔපිස් කාමරේ ඉඳන් පන්තිය පැත්තට ආවෙ. මිසුත් පන්තියෙන් යන්ඩ ලෑස්ති වෙලා පොත් ටික හදා ගත්තා. මිස්ට ඊළඟට අපෙ මල්ලිලාගෙ පන්තිය. ගුරු පුටුවෙන් නැඟිටින්ඩ කලින් ම අශේන් මිස් ළඟට ඇවිත් මොනවදෝ කුටු කුටු ගෑවා.

"කසුන්, ලොකු සර් ඔපිස් එකට කතා කරලා පුතේ. ගිහින් බලන්ඩ."

මගේ ඉහේ මලක් පිපුණා වගේ. දෙයියනේ දැන් තමයි ඇඟට ලේ බිංදක් ඉනුවෙ. එහෙනම් ලියුම ඇවිල්ල ද කොහෙදො. මම තරගෙට සමර්ථ වෙලා ඇති. මම මොකට හිත කලබල කරගත්ත ද මන්දා. මට එවෙලෙ නම් පන්තිය වටේ උඩ කරනම් ගහන්ඩ තරමට හිත. මම දැන උන්නා මම දිනාවි කියලා.

"කසුන් එහෙනම් දිනලා ඇති"

9 772950 655005

මම සඳුන් කියපු දේට ආයෙත් මොකුත් නොකිය ම මිස් පන්තියෙන් එළියට යන්ඩත් කලියෙන් ම ඔපිස් කාමරේට දිව්වා. පන්තියෙන් එළියට පැන්න මතක යි. කෙළින් ම හිටියෙ ඔපිස් කාමරේ ම ද මන්දා. ඒ තරම් ඉක්මනට මම ලොකු සර් ඉස්සරහ.

"මොකෝ ළමයො උඹට වුණේ, යකෙක්වත් පන්නගෙන ආව ද?"

සර් අහපු දේට උත්තර දෙන්ඩ තියා, මගෙ හුස්ම වැටුණෙත් හරි වේගෙට.

"ලොකු සර් මට එන්ඩැයි කීවෙ

"ආ ඔව්, ඔය ළමයා මෙහාට ඩිංගක් ආව නං"

ලොකු සර් මට ළඟට කතා කළා. මම සර්ගෙ මේසෙ දිහා හොඳට විපරම් කර කරා. ළඟට ගියා.

"ඔය ළමයා මේ අවුරුද්දට පාසල් සංවර්ධන ගාස්තු තව ම පියවලා නෑ නේද? ඔය ළමයගෙ මල්ලිගෙ ගාස්තුවත් තව ම එහෙම ම යි. දැන් ගෙවලා අහවර කරන්ඩ දන්නලත් තුන් මාසෙකුත් පහු වුණා. කවද්ද දරුවෝ මේවගෙන් අපි ව නිදහස් කරන්නෙ."

මගෙ උගුර ආයෙ ම වේලන්ඩ වගේ. කකුල් දෙකත් ඩිංගක් පණ නැතිවේගෙන ආවා. මූණෙ තිබ්බ හිනාව නතර වුණේ ඉබේට ම යි. ආසාවල් පස්සෙ හක්වලං කෙරුව ම මිනිස්සුන්ට දුක් වෙන්ඩ වෙනවා කියල දහම් පාසලේ දී ලොකු හාමුදුරුවෝ කියල දුන්නෙ අහවල් කාරණාවකට ද කියල මට එවෙලෙ තේරුණා. ඕනාවට වඩා සතුටු වෙන එකට මටත් මෙච්චා හොඳ පාඩම්. මම මොකවත් ම නොකිය ම ආයෙ ම බිම බලාගෙන උන්නා. එවෙලෙ ඔපිස් කාමරේට වෙන කවුදෝ මන්ද ආවා. මම ඒ කවුද කියලවත් නොබල ම ඔළුව තවත් බිමට ඔබාගෙන ම හිටියා. මොකද, මට ඒ කවුද කියල බලන්ඩ තිබ්බ වුවමනාවට වඩා මගේ මූණ ඒ අයගෙන් වහං කරන්ඩ තිබ්බ වුවමනාවට. ටික වෙලාවකින් ආපු කෙනා පොත් රාක්කෙන් පොත් වගයක් තියලා යනවා වගේ මට තේරුණා. මම යාන්තම් ඔළුව උස්සලා,

"අද ගිහිං අයියට කියන්නම් ලොකු සර්" එහෙම කියල ආයෙ ම මූණ බිමට බා ගත්තා.

අප්පච්චි නැති වුණ දවසෙ ඉඳන් මටයි, මල්ලිට යි හැමදේට ම උන්නෙ අයියා විතර යි. ඕන කං එපා කං එයාට කියනවා ඇරෙන්ඩ වෙන කාට ඉතිං ඕවා ගැන කං කෙඳිරි ගාන්ඩ ද. වෙන කාට ඉතිං එහෙම කරා කියලත් වැඩක් තියෙනවෑ. හිතට නොකැවට බඩට වේලක් හරි වැටෙන්ඩ දීල දැන් ඉතින් ඉන්නෙ අයියා නිසා තමා. ඒත් අපට කන්ඩ දීල එයා නොකා ඉන්නව ද කියලත් වෙලාවකට මට හරි සැක යි. ගල් වළෙන් ඒ හැටි පඩියක් ලැබෙනවා කියලෑ. මුදලාලි මහත්තයට කොච්චර ලාභයක් තිබ්බත් මිනිස්සුන්ට ගෙවන්නෙ එදා ගාණ ම යි. පෝය නිවාඩුවට වැඩ කළා කියලත් අපෙ අයියලාට ඉතින් ඒ හැටි ගාණක් නෑ මයෙ හිතේ.

9 772950 655005

මොක වුණත් මුදලාලි මහත්තයැන්ලගෙ පුතණ්ඩිය කරන වැඩ නිසා මිනිස්සුන්ට තවත් රජ මඟුල්. “ඌත් නොට්ටිගෙ පුතෙක් නොවුණොත් තමයි පුදුමෙ” කියලනෙ ගමේ උන්දැල කතා වෙන්නෙ. ඔය මේ ඊයෙ පෙරේදත් ගල් වළට ඇවිත් හොඳ ජල්ලියක් අල්ලලා ගිහින් තිබුණෙ. මුදලාලි මහත්තයට හොරා උන්දැට පහළ වළෙන් ගල් පටවන්ඩ. අපේ අයියා එහෙම කරයි ඈ ඉතින්. කී දාහක් අතට ගුලි කරත් හොරාට ගන්න සල්ලිවලට වඩා මහන්සිවෙලා වැඩ කරලා හිතේ විශ්වාසෙට හම්බකරන සොච්චමේ සුවඳ රහ කරනවා ඇරෙන්ඩ. ඒ වුණාට මහත්තයැන්ලගෙ පුතා ළඟදි ම මොකක් හරි යටි මගඩියකින් ගල් වළේ රස්සාවෙනුත් අයියා ව දොට්ට දාවි කියලා තමයි අයියා ආයෙ ම කුලී වැඩකට හරි යන්ඩ බලන්නෙ. පව් ඉතින්. ඒ කරුමෙත් අපේ නමට.

සිවුරු පොරවන්ඩ තිබ්බ ආසාවට වඩා නම් දැන් හිතෙන්නෙ ම මටත් රස්සාවක් කරන්ඩ තිබ්බ නම් හොඳා කියලා. ඉස්කෝලෙ ගමනත් යකාට ගියදෙන් කියාල මාත් යනවා කරෝලිස් මෝලේ ලී ඉරන්ඩ හරි. ඒත් කොහෙද, අවුරුදු දොළහෙ උන්ට තියා අවුරුදු දහ අටේ එවුන්ටත් නීතියෙන් තහංචි දාලයි කියල අයියාට හොරෙන් ගොහිං මෝලෙ වැඩ බලන මහත්තයැන්ගෙන් අහද්දි කීවේ. බාල වයස්කාර කියල ද කොහෙද. නීතියත් ඉන්නෙ ඉතින් අපේ හච්හරණෙට නෙවේනෙ කොහොමත්.

"ළමයො, ළමයො. කසුන්."

ලොකු සර් කතා කරපු පාර මාව ගැස්සිල ගියා.

"ඇස්වල කඳුළු පිහ ගනින්කො ඔක්කොට ම කලින්."

ලොකු සර් එහෙම කියනකොටයි මටත් තේරුම් ගියේ, මටත් හොරා ඇහැට ඇඬුම් ඇවිත් කියලා. ඒත් ඒ වගක් මට දැනුණෙවත් නෑ.

මම විගහට අත් දෙකෙන් ම ඇස් දෙක ඇදල දැම්මා.

"මට උඹලගෙ අමාරුකම් නොතේරෙනව නෙවේ දරුවො. ඒත් මම කියලත් මක් කොරන්ඩ ද? අමාත්තයංසෙන් අපිට නොවැ මේ ලියුම් ගහන්නෙ. ඒකත් පිට පිට ම."

ඇස් පිහ දැම්මට මොකෝ තව තව කඳුළු වැක්කෙරෙන්ඩ ඔන්න මෙන්න. ඒත් මම දත කට පූට්ටු කරගෙන ම හිටියා. වෙලාවෙ හැටියට මට ඒක වීරකමක් කියලා හිතුණා.

"අද හෙට ම පියවන්ඩ බලන්ඩ කියලා අයියණ්ඩිට පොඩ්ඩක් මතක් කරහන්කො එහෙනම්."

මට ඕනෙ වුණේ හොඳයි ලොකු සර් කියල කියාගන්ඩ ඒත් ඒ වචනවලට තිබ්බ හයිය මක් වුණා ද කියලා හිතන එක කොයි හැටි වුණත්, මට ලොකු සර් ඉස්සරහ පුළුවන් වුණේ ඔළුව හොලෝල එන එක විතර යි.

9 772950 655005

ආපහු පන්තියට යන ගමන් කරාමෙ ළඟට ගිහිං මං මුළු මූණෙ ම වතුර උලා ගත්තා. ඒ වෙලෙත් කඳුළු එක දිගට එළියට පැනලා. මං පන්තියට යනකොට ඉතිහාසය සර් පන්තියෙ ළමයින් ව කුඹුක් ගහ යටට ගෙනිහිල්ලා. පන්තියෙ ඉතිරි වෙලා තිබ්බෙ මගෙ පුටුව විතර යි. ඇති යන්තම්. දෙයියන්ට පින් දිදී මම ඇවිත් කුඹුක් ගහ ගාවට නොයා ඩෙස් එකට මූණ ඔබාගෙන උන්නා. දැං ඉස්කෝලෙ ඇරෙන්ඩත් කිට්ටු යි මගෙ හිතේ. එහෙම හිතලා ඇස් පිහගෙන ඔළුව උස්සනකොට ම මුර සීයා බැල් කණුව ළඟ. ළමයි හූ හඬ ගාගෙන පන්තියට ආවා. මට හැමෝගෙන් ම මූණ හංගගන්ඩ ම යි හිත.

"කසුන් මොකෝ වුණේ."

මං සඳුන්ට මොකවත් නොකිය ම කඳුළු ඒවි කියන බයට දත් මිටි කාගෙන හිටියා.

"ඇයි දිනලා නැද්ද?"

හැමෝම තම තමන්ගෙ පුටුව ඩෙස් එක උඩින් නවනකොට තවත් සද්දෙ වැඩි වුණා. ඒක මහා වාතයක්. වෙනදට මේ සද්දෙට මොන තරම් ආස වුණත් සද්ද කරන හැම එකාට ම ගිහිං තලන්ඩ ම යි මගෙ හිත් වැදුණෙ. ඒ අස්සෙන් කවුදො මගෙ නම කිය කියා බෙරිහන් දෙනවා.

මලිති,

"කසුන් , කොහෙද දෙයියනේ හිටියෙ. සිංහල සර් ඔයා ව හොය හොයා මුළු ඉස්කෝලෙ ම පීරනවා. ඔයා අර ගියපු පළාත් තරගෙන් පළවෙනි තැනට තේරිලාලු. ඉක්මනට යන්ඩ සර් බලාන ඉන්නවා."

සඳුන් එක පාරට කෑ ගහන්ඩ ගත්ත. මගේ බෙල්ලත් බදාගෙන ම. පන්තියෙ හැම එකා ම අපි දෙන්නා දිහා බලාගෙන.

"මේ ඇහුණදෝ, කසුන් අර තරගෙන් දිනලෝ. මගේ යාළුවා දිනලා. එයා ඊළඟ තරගෙට සමර්ථ වෙලා. සමස්ත ලංකා තරගෙට කසුන් තේරිලා. හේ....හේ.... මම දැනං උන්නා කසුන් ඒ තරගෙන් දිනාවි කියලා."

අනේ පව්! සඳුන් හරියට එයා දින්නා වගේ. මුළු පන්තියට ම ඇහෙන්ඩ බෙරිහන් දෙනවා. ඒකත් උඩ පැන පැන ම. මට හරියට එයා ගැන දුක හිතුණා.

"ඕක ඔච්චරට කෑ මොර දෙන්ඩ දෙයක් ඈ. පළාත් තරගෙන් දින්න විතරනෙ. මොකද මෙයා සමස්ත ලංකා තරගෙන් දින්නෙ නෑනේ."

ඇයි මන්ද අශේන් මෙච්චර මා එක්ක හිත නොහොඳ. හැම වෙලාවෙ ම පරහට ම යි. මන් මොන වැරද්දක් කළාට ද. අපේ අයියා ගල් වළේ වැඩ කරනවටත් අශේන් ඒ තරම් මනාප නෑ. අශේන්ලගෙ

තාත්තාගෙ ගල්වළේ තමයි අපේ අයියා වැඩ කරන්නෙ. එයාට වෙන කෙනෙක් දින්නොත් ඇස්වල කටු අනිනවා වගේ. වාර පරීස්සනේටත් එයාට වඩා කාගේ හරි ලකුණක් වැඩි වෙච්චි දාට හරියට අරියාදුව.

මක් කොරන්ඩ ද, කෝන්තර තියා ගත්තොත් අපෙ අයියාගෙ රස්සාවත් මුදලාලි මහත්තයැන්ට කියල නැති කරල දාවි. එයත් ඉතින් එයාගෙ අයියා වගේ ම තමා. අනික් ළමයිනුත් අශේන් එක්ක පැටලෙන්ඩ යන්ඩ බය යි. හදිස්සියකට පොලියට හරි අතමාරුවක් ඉල්ලගන්ඩ කියලා ඉන්නෙ මුදලාලි මහත්තයන්ල විතරනෙ. ඒ නිසා එයාලගෙ අම්මලත් අශේන් එක්ක හිත් නරක් කරගන්ඩ එපා ය කියලලු තියෙන්නෙ. සඳුන් ආයෙත් මොකවත් නොකීවෙත් ඒක නිසා වෙන්ඩ ඇති.

ඡත්ත මානවක ගාථා කියලා ඉවර වෙලා මං සඳුනු යි පොඩි මල්ලි යි එක්ක පංකජ සර් ගාවට ගියා.

සර් ලියුම් කවරෙකු යි, කඩදහියකු යි අතේ තියාන ඉස්කෝලෙට ගොඩවෙන පල්ලම ළඟ ඉඳන් හරි වුවමනාවෙන් මොනවදෝ කියව කියව හිටියා. මගෙ ලියුම.

"සර්"

මම සර්ට කතා කරපු විගහින් සර් මං දිහා බැලුවා. ඒත් එක්ක ම සර්ගෙ ඉහේ මල් පිපුණා වගේ.

"කසුන්, කොහෙද මනුස්සයෝ හිටියෙ. මං පණිවිඩ කීයක් නම් යැවුව ද දරුවො."

සර් එක පාරට ම මාව බදා ගත්තා. කීප වංගියක් ම  ඔළුවත් අත ගෑවා.

"මං දැනං හිටියා කොල්ලා කොහොම හරි වැඩේ ගොඩ දානවා කියලා."

සර්ට වෙනද වගේ වචන කියවුණෙත් නෑ හරි හරියට.

“මුළු ඉස්කෝලෙට කසුන් ලොකු ආඩම්බරයක්. අපේ කලාපෙන් සමස්ත ලංකා තරගෙට යන එක ම ළමයා කසුන් විතර යි. ඒක නිසා අපිට විතරක් නෙවේ අපේ කලාපෙටත් කසුන් ගොඩක් වටින තරගයක් ඔයා මේ දින්නෙ මයෙ පුතේ."

පංකජ සර් මොන තරම් සතුටෙන් ද? මම දැක්ක ඇස් අගිස්සෙ කඳුළකුත් තියනවා. සර් එක හුස්මට කියෝනවා. ඊටත් වඩා සර්ගෙ මූණෙ හිනාව.

දැං ඉතින් ඊළඟ තරගෙත් දින්නඩ මහන්සි ගන්ඩ ඕනෙ කොල්ලො. කියන දේවල් හරියට ඔළුවට දාගෙන. කල්පනාවෙන් හොඳට හිතලා බලලා බය නැතුව තරග කළොත් සමස්ත ලංකා තරගෙනුත් කසුන්ට අනිවාරයෙන් ම දිනන්ඩ බැරිවෙන එකක් නෑ. හැබැයි අපිට වැඩි කාලෙකුත් නෑ. තරගෙ මේ එන සෙනසුරාදා."

"ඒ කියන්නෙ අනිද්දනෙ."

9 772950 655005

හැබැට මට වඩා මේ තරගෙට උනන්දුව සඳුන්ට.

"ඔව්, අනිද්ද උදේ නවයට. කොළඹ ආනන්ද විද්‍යාලයෙ තියෙන්නෙ."

"කොළඹ ගොඩක් දුර ද සර් තියෙන්නෙ"

"ඔව්, ටිකක් දුර. කසුන්ට පාන්දර කෝච්චියෙන් ම පිටත් වෙන්ඩ වෙයි."

සඳුන් කඩවෝරු ආච්චිට පහේ කාසියක් දික් කරල අච්චාරු ගොට්ටක් ගත්තා. අපේ මල්ලිත් ඒ දිහා බලාගෙන කෙළ උනනවා. මම මල්ලි දිහා රවලා බැලුවා ම එයා බිම බලා ගත්තා. සඳුන් වගේ හැමදා ම අච්චාරු ගන්ඩ අපිට කොයින් ද කාසි. ඒත් සඳුන් හැමදා ම මට යි මල්ලිට යිත් නොදී ඉන්නෙ නෑ. මල්ලි නම් පෙරේතයා. සමහර දාට කැන්ද කොළෙත් එක්ක ම ලෙව කනවා. සඳුනුත් ඉතින් අපෙ මල්ලි ඉල්ලුව ම බෑ නොකිය දෙනවා. එයා හරි හොඳයි. හිතේ කිසි නරකක් නෑ. ඉඳල හිටල කඩවෝරු ගන්ඩ කාසියක් ගෙනා දාට අයිස් පලමෙන් අපිත් එයාට දෙනවා.

"කසුන් දුකෙන් ද ඉන්නෙ, තරගෙ දින්නට සතුටු නෑ."

මන් කොහොමැයි සතුටු වෙන්නෙ. එත් ඒක සඳුන්ට කියන්නෙ කොහොම ද?

"එහෙම එකක් නෑ, මට සතුටු යි."

සඳුන් එනකම් ම තරගෙ ගැන ම යි අහ අහා ආවෙ.

එදා රෑ මට එක එක දේවල් හිතුණා. කලාප කාර්යාලයෙන් තව පහු වෙලා ලියුම තැපැලට දැම්ම නම්. පියුම් මාම අතින් මගෙ ලියුම එහෙ මෙහෙ වුණා නම්, මට මේ තරගෙට යන්ඩ ඕනෙත් නෑ. මෙහෙ ඉඳන් ටවුමට යන්ඩත් රුපියල් තිහක් යනවා. එහෙව් එකේ කොළඹට ම යන්ඩ කීයක් නම් යයි ද? ඇරත් ගිහින් ආයෙ ම එන්ඩත් එපැ යි.

අයියට කොහොමද මේ වගක් කියන්නෙ. පළාත් තරගෙට යන්ඩත් මුදලාලි මහත්තයගෙන් පඩියෙන් කපා ගන්ඩ කියලා රුපියල් එකසිය පනහක් ඉල්ලන් තිබුණා කියල මට ආරංචි වුණේ තරගෙට ගිහින් ඇවිත් දවස් තුන හතරකට පස්සෙ පියසීලි නැන්දගෙන්. එදත් මුදලාලි මහත්තයා වංහුං සේර ම හොයලා. වැඩක් නැති දේවල්වලට සල්ලි නාස්ති කරනවැයි කියල අවලම් කතා ගොඩකුත් කියුවයි කියලා නැන්දා කීවෙ. මාව එක්කරන් යන්ඩ වරුවක නිවාඩුවක් දැම්මටත් දවසක ම පඩිය කපලා. එහෙව් එකේ කොළඹ ගමනක් ගැන කියුවොත් ආයෙ ම අයියට මුදලාලි මහත්තයැන්ලා ඉස්සරහ බාල්දු වෙන්ඩ වේවි. නැත්තම් මේ මාසෙ ම පඩිය ණය වෙන්ඩ වේවි. එහෙම වුණොත් අපිට කෙසේ වෙතත් මල්ලිට කහට උගුරවත් නැති වෙයි. ඒ ඇරත් තව ම පාසල් සංවර්ධන ගාස්තු ගෙවලත් නැනෙ. දැන් තියන ලොකු

ම ඉහේ බර ඒක. ලබන සතියෙවත් නොගෙවුවොත් ලොකු සර් ආයෙ ම වංගියක් මාව ඔපිස් කාමරේට ගෙන්නාවි.

රෑ නින්ද නොගියට මොකෝ මම උදෙන් ම නැගිට්ටා. බුදු පහන ලෑස්ති කරලා, කැලෑ කොළ මැල්ලුමට කොළ තෝරලා ඉක්මනට ඉස්කෝලෙ යන්ඩ ලෑස්ති වුණා. අයියා කහට කෝප්පෙ පෝරණුව උඩින් තියලා මුට්ටිය ලිපෙන් බානකොට මම කෙහෙල් කොළෙත් ලෑස්ති කරා. කහට කෝප්පෙ අතට ගන්නකොට ම අයියා ගිහින් පොඩි මල්ලිව කුද්දගෙන ආවා. තවමත් නිදි කඩ කඩ අයියගෙ කරේ. අප්පච්චිට පස්සෙ මල්ලි ව හැමදා ම වගේ කීද්දුවෙ අයියා. එයා කාටත් වඩා මල්ලිට ආදරෙයි. මාත් එහෙම යි. දසුන් මල්ලිට කොහොමත් හැමෝ ම ආදරෙයි. අපෙ ඉංගිරිසි ටීචත් මල්ලිට හරි ආදරෙයි. හරි පින් පාට යි කියලා කීප සැරයක් ම ඉඹලත් තියනවා. පන්සලේ ලොකු හාමුදුරුවොත් කීපවිටක් ම මල්ලි ව මහණෙට ඉල්ලුවා. අප්පච්චි ඉතින් කැමති වුණ එකක් ඈ.

කොහොම වුණත් දසුන් මල්ලි අහිංසකයා. අපේ පවුලෙ කාගෙවත් නැති තරම් දසුන් මල්ලිගෙ පොත්තත් සුදු ම සුදු යි. අම්ම යි, අප්පච්චි යි හිටියෙත් අඟුරෙන් උලලනෙ ඉතින්. මල්ලිගෙ ඇස් දෙකත් හරි ලස්සන යි. හරියට අපෙ පන්තියෙ අශේන්ගෙ වගේ ම යි. හැමදේට ම කට කැඩිච්චි කතා කියන ගුණවතී ආච්චිත් නිතර ම  කියනවා. “අයියලා දෙන්නට වඩා නම් මල්ලි පාට යි නෙ” කියලා. ඒත් ඒ කටින් හොඳක් කියනවා මං ඔය ඇහුව ම යි. ඒත් එහෙම කියන වෙලේට අපෙ අයියා මූකුත් ම නොකිය බිම බලාගන්නවා. මං එයාගෙන් ඒ ඇයි කියල කීප විටක් ම ඇහුවට එයා උත්තරයක් නොදීම කර අරිනවා. ඒ ඇයි කියන්ඩ මම දන්නෙත් නෑ. හැබැයි ඉතින් ගුණවතී ආච්චිගෙ කෙළ හැළුණු තැනක හිතක් නොපෑරෙන්නෙත් නෑ. ඒ හිංද මම දැන් එයාගෙන් ඒ ගැන අහන්නෙත් නෑ.

"ලොකු අයියෙ ඊයෙ ඉස්කෝලෙදි."

දසුන් මාව දැක්ක ගමන් කටමැත දොඩවන්ඩ ගත්ත. සේර ම අහවර වෙන්ඩ යි යන්නෙ කියලා මට තේරුණා.

"ඇයි මොකෝ වුණේ."

අයියා හොඳ සෝදිසියෙන් දසුන්ගෙන් අහන්ඩ ගත්තා. ඒ කාලෙ අප්පච්චිත් ඔහොම ම යි. අපි මොනවා හරි ජංජාලයක් කරගෙනෑ යි කියලා දහ අතේ බය වෙනවා.

"සිංහල සර් මෙයාට සෑහෙන්ඩ හොඳ කීවා. මෙයා ව බදාත් ගත්තා. අර කලින් දාපු තරගෙ දිනල ලු. ඊළඟ තරගෙ හෙට ද කොහෙදො මයෙ හිතේ. කොළඹ යන්ඩ ඕනෙ යි කියලත් කියනවා මං අහගෙන. කොළඹ හුඟක් දුරලු නේද තියෙන්නෙ. ඕං පාන්දර කෝච්චියෙන් ම යන්ඩ වේවි හොඳ ද."

9 772950 655005

මට දසුන් එක්ක කේන්තියක් ආවෙ. හැමදේ ම නැගිටපු ගමන් අයියගෙ කනේ තියන්නෙ මොන එහෙකට ද? දැන් මක් කරන්ඩ ද? මම කියපු දේවල් නෑහුණා වගේ කහට කෝප්පෙ එක උගුරට බීවා. සීනි අහුරත් එක පාර ම කටේ දාගෙන බුදු පහනට වැන්දා.

"ඇයි ඊයෙ රෑ මේ වගක් නොකීවෙ."

අයියා ඉස්සරහ දණ ඔබන කොට අහපු දේට වචනත් නැති ව ගියා.

" මේ......මට...... මේ....... කල්පනාවක් වුණේ නෑ"

අයියා ඔළුව අතගෑවෙ වෙනදට වඩා තදේට වගේ කියල මට හිතුණා.

"එහෙනම් මුදලාලිට කියලා නිවාඩුවක් දාන්ඩ වෙයි."

අම්මට මල්ලි හම්බ වුණාට පස්සෙ අයියගෙ මූණෙ මෙච්චර සතුටක් මම දැක්ක ම යි. ගිය පාරට වඩා මෙදා පාර අයියගෙ මූණ හරි ඉක්මනට මහ ගොඩක් එළිය වුණා. කවදාවත් නැති ව ම බත් මුල අතට ම ගෙනත් දුන්නා. උඩ පැන්නෙ නැති වුණාට ගේ වටේ ම ඔහේ ඇවිදිනවා. සිහිය නෑ. අප්පච්චිටත් සතුටක් ආව ම මෙහෙම ම යි. එයත් අද උන්න නම්. අප්පච්චි ඉන්නකොට නම් ගමේ හැමෝ ම අපිත් එක්ක හොඳා. ඒ දවස්වල හැම සෙනසුරාද ම අප්පච්චි අපි ව දුම්මල කන්දෙ පන්සල් එක්කන් යනවා. රේල් පාර අද්දර මල් ගහෙන් අප්පච්චි එක්ක මල් කඩාගෙන ඇවිත් වට්ටිය හදන්නෙ මම. අප්පච්චිට වකුගඩු ආධාරේ අන්තිමට හම්බ වුණ මාසෙ පෝය දා සුමේධ හාමුදුරුවන්ට සිවුරක් පූජා කරන්ඩ දුන්නෙත් මා අතට ම යි. ඒත් දැං කොයින් ද දෙයියනෙ එහෙම වාසනාවක්. හොඳ වෙලාවට අයියා හරි අපට ඉතුරු වුණේ. හැබැයි ඉතින් එයත් නැත්තම් මගෙ යි මල්ලිගෙ යි කාන්සියට සේපාල කනත්තෙ මෙලහකටත් මල් පිපිලා.

"නිවාඩු ගන්ඩ ඕනැන්නෙ නෑ. මං තරගෙට යන්නෙ නෑ. "

"එහෙම කියනකොටත් මගෙ ඇස් අග ආයෙ ම වංගියක් කඳුළු.

"ඒ මොකෑ?"

අයියගෙ නළල රැලි ගැහුණා.

"මේච්චර දුර ඇවිත් ආයෙ ම හැරෙන්ඩ ද කල්පනාව."

ඒ අහපු දේට මට තවත් ඇඬුම් ආවා. රෑ දවල් බලන් නැති ව මමත් තරගෙට මහන්සි වුණානෙ. පංකජ සර්ගෙන් බැණුමුත් අහගෙන, හිල් වෙන්ඩ අනින ටොකු දෙක තුනත් කාගෙන, වංගියක් දණත්

ඔබාගෙන ම පන්තියෙ එළිපත්තෙ ඉන්ඩ වුණේ මේ තරගෙ නිසානේ ඉතින්. මට වඩා මේ තරගෙ අයියට යි, පංකජ සර්ට යි කප්පරක් වටිනවා. අනික මම දිනනවා කියන්නෙ මගේ ඉස්කෝලෙ ම දිනන එකනෙ.

" ඒ වුණාට, තියෙන්නෙ ළඟපාතක නෙවෙයිනෙ. යන්ඩ එන්ඩ කීයක් නම් වියදම් වෙයි ද? පෑන් පැන්සල් ගන්ඩ, කෑම බීමවලට, මහ වියදම්. අනික දවසක පඩිය දවස් තුන හතරට අල්ලලා කපලා දාවි මුදලාලි මහත්තයා. ඒ විතරක් ඈ, නිවාඩුව ඉල්ලන්ඩ ගියහ ම දාහක් දේවල් අහගන්ඩ වෙයි. තරගෙට මෙදා පාර කොළඹ ලොකු ඉස්කෝලවල ළමයිනුත් එනව ලු. ඒ ඇයො එක්ක තරග කරල දිනන්ඩ පුළුවනෑ මට. එයාල ගොඩක් ලොකු ඇයෝ. මට ඇහැකි ද එයාල එක්ක හැප්පෙන්ඩ. ගොහින් නිකන් පරදිනවට වඩා ගමේ ඉන්න එක හොඳා. අනික මට ලොකු හීන ඕනෑන්නේ නෑ"

මම එක සීරුවට කියාගෙන ගියා. මම මෙ විදිහට අයියට හැලි කියල ම නෑ .එයා හුඟ වෙලාවක් මා දිහා බලාන උන්නා. මට හිතුණා මට හොඳ පාරක් දේවි කියලා.

"හෙට පාන්දර කෝච්චියෙ ම යන්ඩ ලෑස්ති වෙන්ඩ "

මෙච්චර දේවල් කියලත් අයිය කට හෙල්ලුවෙ ඒ වචන ටික හලන්ඩ විතර යි. මහ හුඟක් ඉගෙන ගත්තෙ නැතුවට ඔය කොයි කාටත් වඩා අයියාට හැමදේ ගැන ම දැනුම් තේරුම් තියෙනවා. දහයෙ විභාගෙන් පස්සෙ ආයෙ එයා ඉස්කෝලෙ නොගියෙත් අපි දෙන්න නිසානෙ. ගල් වළේ රස්සාවත් දැන් නම් අයියට බර වැඩි. වම් පැත්තෙ වකුගඩුව අප්පච්චිට දුන්නට පස්සෙ දොස්තරලා කොච්චර පරිස්සම් වෙන්ඩ කීවත් අහන එකක් ඈ. ඉස්සරට වඩා ඇදිලත් ගිහිං. ඔය ඔක්කො ම ඉතින් හිතේ හයියට තමා.

මට මං ගැන ම කේන්ති ආව. ඇයි මම ඒ විදිහට ගෝරනාඩු තිබ්බෙ කියලා. රේල් පාර දිගේ ගුරු පාරට වැටෙනකම් ම මම කඳුළු පිහිද පිහද ආවේ.

පළවෙනි කාලච්ඡේද ඉවර වුණ හැටියෙ ම පංකජ සර් පන්තියට ඇවිත් මාව එක් කරගෙන ගියා. මම පුටුවෙන් නැගිටල පන්තියෙන් එළියට යනකම් ම අශේන් ඇරුණු කොට හැම කෙනා ම මාත් එක්ක හිනා වුණා. උදා රැස්වීම වෙලේ ලොකු සර් මම තරගෙට යන එක ගැන කියනකොටත් අශේන් මාව ගිලින්ඩ වගේ උන්නෙ. අනිත් ළමයි අත්පුඩි ගහනකොටවත් අත් දෙක හෙල්ලුවෙවත් නෑ. මම එයාගෙ ඩෙස් එක ගාවින් එනකොට ම එයා ඩෙස් එක එකපාරට ම මගේ කකුලට හරස් කළා. මට මහා වේදනාවක් ආවා, කේන්තියක් එක්ක ම. මක් කොරන්ඩ ද. ඕවට ඉතින් එකට එක කරන්ඩ අපි පෑහෙන්නෙ නෑනෙ.

පංකජ සර් උදේ ඉඳන් ම මට තරගෙට ඕන කරන හුඟක් දේවල් කියල දුන්නා. මම තරගෙට යනව ද නැද්ද? තව ම නෑ, ඒත් සර්ගෙ මහන්සිය නිසා ම මම හැමදේ ම හොඳට අහගෙන උන්නා. කිසි ම ව්‍යාකරණයක් වැරැද්දුවෙත් නෑ. ආඛ්‍යාත හරියට ම තියලා සර් කියාපු රචනා හැම එකකට ම වගේ කරුණු හොඳට ගළපලා තියලා ලියුවා.

9 772950 655005

"කසුන්, හෙට තරගෙදි ඔතන මාතෘකාවලින් තමන්ගෙ රචනාවට තමන් කැමති මාතෘකාවක් තෝරගන්ඩ කියුවොත්"

එහෙම වුණොත් ඇත්තට ම මම මගේ රචනාවට මොන මාතෘකාව කියල තෝරා ගන්ඩ ද? මොන මාතෘකාව ගැන ද මට හොඳට ම ලියන්ඩ පුළුවන්. කියවන කෙනාට හොඳයි කියල හිතෙන විදිහෙ හොඳ එකක්.

ඒ ගැන සර්ගෙන් අහන්ඩත් කලින් ම ඉස්කෝලෙ අරින්ඩ බැල් එක ඇද්දා. මට ඒ ගැන හිතන්ඩවත් වෙලා නෑ. ඇත්තට ම එහෙම වුණොත් මොන මාතෘකාව ද තෝරාගන්නේ. ඒකට ඉතින් මම හෙට තරගෙට හිටින්ඩ යන්ඩ එපැ යි.

"අද එහෙනම් හවස් වරුවෙ නවතින්ඩ ඕනෙ වෙන්නෙ නෑ කසුන්"

සර් එහෙම කියන්ඩ ඇත්තෙ හෙට පාන්දර ම පිටත් වෙන්ඩත් තියනවැයි කියලා හිතාන වෙන්ඩ ඇති. එහෙම කියලා සර් මට පන්තියට යන්ඩ කියුවා. ගෙදර ගිහිනුත් ආයෙ ම මාතෘකා ටික බලාගන්ඩ කියලා සැරෙන් සැරේ මතක් කරා. සර් කියපු හැමදේ ම මම හොඳට අහගෙන හිටියා. කොච්චර නම් පංකජ සර් තරගෙට මාව මහන්සි කරවනව ද? ඒත් මං කොහොම ද සර්ට කියන්නෙ මට තරගෙට යන්ඩ වෙන එකක් නෑ යි කියලා. එහෙම කියුවොත් සර් මට හොඳට ම බණීවි. ලොකු සර් ගාවටත් දාවි. පස්ස පැත්තෙ පාර හිටින්ඩ ලොකු සර් මට වේවැලෙන් තලයි. දොට්ට පිලටවත් යාගන්ඩ බැරි වෙන්ඩ ම. බාගදා මාව ඉස්කෝලෙනුත් අහක් කරල දමාවි.

කමක් නෑ එතකොට මට තරගෙට යන්ඩ ඕනෑ වෙන්නෙ නැනෙ. බැණුම් අහලා, ගුටි කාල හරි මම ගමට වෙලා ඉන්නවා. ඉස්කෝලෙන් අස් කරොත් හොරාට වයස කියලා කළුන්දැවෙ කොහු මෝලෙ කොහු බත් රහින්ඩ හරි යනවා.

එහෙම හිතාන මම සිංහල සර්ගෙ කකුල් දෙක අල්ලලා වැන්දා. වැඳලා නැගිටිනකොට ම සර් සාක්කුවෙන් අරගෙන,

"කසුන් මේකත් තියාගන්ඩකො හෙට මඟ වියදමට හරි" කියලා රුපියල් පන්සීයෙ කොළයක් මගෙ අතේ උන්ඩි කරා."

"මාත් හෙට යන්ඩ එන්ඩ යි හිටියෙ. ඒත් හෙට පෙළ පොත් වගයක් බලන්ඩ ලොකු සර් කලාප කාර්යාලයට යන්ඩ යි කීවනෙ"

දෙයියනේ! මට උන් හිටි තැන් අමතක වුණා. මෙච්චර ලොකු නෝට්ටුවක්! එහෙම තියා සර්ගෙන් කොහොම ද සල්ලි ගන්නෙ.

9 772950 655005

"එපා සර්, අයියා ගාව සල්ලි තියනව කීවා. ඇරත් හෙට අයියා මා එක්ක යන්ඩත් එනවා."

එහෙම කියල මම ආයෙ ම පංකජ සර්ගෙ අතට පන්සීය නෝට්ටුව දික් කරා. අප්පච්චි පොඩි කාලෙ ඉඳන් අපි තුන්දෙනාට කීවෙ කාටවත් අතපාන්නෙ නැතුව ජීවත් වෙන්ඩ ඕනෙ කියලා. මට ඒක එවෙලෙ ඉබේ ම ඔළුවට ආවා. ඒ නිසා ම මම ඒ සල්ලි ගන්ඩ බෑ ම කියලා සර්ගෙ මේසෙ උඩින් තිබ්බා.

"පැහෙන්නෙ නැතිව මේක ගන්නවා දරුවෝ."

සර් බොරු තරහක් මවාගෙන මයෙ කමිස සාක්කුවට සල්ලි දාල ආයෙ ම ඔපිස් කාමරේ පැත්තට ගියා. සර්ගෙ පෙරැත්තෙ නිසා ම මට ඒක නොගෙන ඉන්ඩ බැරි වුණා.

පන්සීයක්! කොළඹ යන ටිකට් එක එකසිය පනහ යි. උදේ මම එන ගමන් ස්ටේසන් මාස්ටර්ගෙන් නිකමට වගේ අහගෙනයි ආවෙ. භාග ටිකට් එක හැත්තෑ පහ යි.

මේ සල්ලිවලින් නම් කොළඹ යන්ඩ එන්ඩ පුළුවනි. ඒත් අයියා මට බණීවි. සර්ගෙන් සල්ලි ගත්තා කියලා. ඇයි ආයෙ ම නොදී ආවෙ කියලා දෙහිත් කපාවි. දැං මොකද කරන්නෙ. මම එහෙම හිත හිතා පන්තියට යනකොට ම ළමයි ගාථා කියන්ඩ පටන් ගත්තා. මං හිටියෙ දෙගිඩියාවෙන්. පංකජ සර්ගෙන් සල්ලි ගත්තු එකට. ගාථා කියලා ඉවර වෙලා මං ලොකු සර්ගෙ කාමරේට ගියා. ලොකු සර්ට කතා කරලා එන්ඩ. මම යනකොටත් පංකජ සර් ලොකු සර් එක්ක බර කතාවක. ලොකු සර් මාව දැකපු ගමන් මං දිහාට හැරුණා.

" කසුන්, ඔය දරුවා එහෙනම් හෙට හොඳට තරගෙට හිටින්ඩ ඕනෑ. පංකජ සර් දැනට ම ඕනෙ කරන උපදෙස් එහෙම දීල ඇති නෙ. සර්ගෙ මහන්සියට සාධාරණයක් කරන්ඩ ඕනෙ කොලුවෝ."

" හොඳම යි ලොකු සර්."

එහෙම කියන කොට පංකජ සර් මං දිහා බලාන හිනා වුණා.

"මට මතක ඇති දාක මේ ඉස්කෝලෙ තියා කලාපෙ කිසි ම ඉස්කෝලෙක ළමයෙක්ට සමස්ත ලංකා තරගයක් දිනනවා තියා අඩු ම තරමෙ පළාත් තරගෙකට වාඩි වෙන්ඩ සුදුසුකමවත් ලැබිලා නෑ. ඔය ළමයා හෙට මේ තරගෙ දින්නොත් ඒක ඉස්කෝලෙට ලොකු ගෞරවයක්. කලාපෙට උනත්. කිතල් ඇල්ල කනිෂ්ඨයෙන් සමස්ත ලංකා ජයග්‍රහණයක් ගෙනේවි කියලා එහෙනුත් මහා බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නෙ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා මට අද උදෙත් කතා කළා පංකජ සර්, මේ දරුවා ගැන අහලා."

සර් එහෙම කියන කොට නම් මගෙ හිතටත් ලොකු සන්තෝසයක් ආවා. පොඩි ආඩම්බරයකුත් එක්ක ම.

9 772950 655005

"මේක ඔය ළමයට විතරක් නෙවෙයි, මුළු ඉස්කෝලෙට ම වටින තරගයක්. ඒක ඉතින් දිනා ගන්ඩ හොඳ සිහියෙන් තරග කරන්ඩ මහන්සි ගන්ඩ ඕනෙ. දින්නොත් ඉතිං බැරියැ පිරිමි විද්‍යාලෙට කොයි හැටි වෙතත් මධ්‍ය මහා විද්‍යාලෙට හරි පැන ගන්ඩ. සල්ලි තිබුණත් මේ ගමේ මොන එකාට ද එහෙම වාසනාවක් ආවෙ. එහෙනම් හෙට හොඳට තරගෙට හිටින්ඩ ඕනෙ දරුවො."

මම ඔපිස් කාමරෙන් එළියට එනකොට මල්ලි මුර සීයත් එක්ක කියව කියව පල්ලම ගාව. ගුරුපාර දිගේ එනකම් ම මම හිටියෙ පංකජ සර් දුන්න සල්ලි ගැන හිත හිත.

"ඔයා මේ තරගෙ දින්නොත් ටවුමෙ ඉස්කෝලෙකට යනවා ද? එහෙ ඉස්කෝල ගොඩක් ලොකුයි ලු නේ ද? ලොකු සෙල්ලම් පිට්ටනියකුත් තියනව ලු. ළමයිනුත් හුඟාරියක් ඒ ඉස්කෝලවලට එනව ලු, එහෙ ගියොත් මේ ඉස්කෝලෙට වඩා අකුරු ගොඩක් ඉගෙන ගන්ඩත් පුළුවනි කියල මුර සීයා කීවෙ. ඔයා එයින් එකකට යනව ද? එහෙම වුණොතින් මට හැමදා ම තනිය ම තමා ගෙදර යන්ඩ වෙන්නෙ."

"මම අපේ ඉස්කෝලෙ දාල වෙන කොහෙවත් යන්නෑ. දහයෙ විභාගෙට ඉඳගන්නෙත් මම මෙහෙම යි. මට අපේ ඉස්කෝලෙ අකුරු ටික හොඳට ම ඇති."

දසුන් හෙන වාතයක් වෙලේකට. එහෙම හිතලා මම එයා දිහා බැලුවෙ උදේ තිබ්බ කේන්තියටත් එක්කල ම බනින්ඩ. එතකොටයි මම දැක්කෙ,

"දසුන් කොයි බෙල්ලෙ එල්ල තිබ්බ්ච්ච පංචායුදේ."

මම එයාගෙ බෙල්ල දිහා බලනකොට ඒක තිබුණෙ නෑ. අප්පච්චි ඒක ඉස්සෙරින් ම හඳවල තිබ්බෙ අයියට, මගෙන් පස්සෙ මම ඒක පරිස්සම් කරන් හිටියෙ දසුන් මල්ලිට එයා ඉපදෙන්ඩත් කලිං ඉඳන් ම. එයාටත් යන්තම් මාස තුන ලැබුව දා මම යි ඒක දසුන්ගෙ කරේ දැම්මේ. අම්මගේ තුන් මාසේ දානේ දුන්නෙත් එදා ම නෙ. ඒත් දැන් එයා ඒක නැති කරගෙන.

" ඔයා තරගෙට යන්නෙ නැතුව ඉන්ඩ එපා. මම අයියට උදේ පංචායුදේ නූල කපල දුන්නා. ඒක සල්ලි කරල ඔයාව තරගෙට එක්කන් යන්ඩ කියලා. මට රිදුණෙ නෑ. කණ්ණාඩි කැල්ලෙන් බලාගෙන මං කැපුවෙ. කොළඹ තියෙන්නෙ අපෙ ටවුමටත් එහැයින් ලු නෙ.

මට ඒ ගමන දසුන් මල්ලි ගැන ගොඩක් දුක හිතුණා. ඒත් අයියා ඒක මොකට ගත්ත ද?

"අර මොකෝ අර."

වෙල පහුවෙනවත් එක්ක ම දසුන් මල්ලි ස්ටේසම දිහාට අත දික් කරල පෙන්නුවා.

මිනිස්සු රොත්තක් වට වෙලා රේල් පාර මැද්දෙ ම. දවල් කෝච්චියත් අද තව ම ස්ටේසමේ නවත්තලා. මොකක් හරි කලබලයක් වගේ. ඒ අස්සෙ මිනිස්සු එක්කෙනා දෙන්නා එහෙ මෙහෙ දුවනවා. අපිත් ඒ දිහාට දුවගෙන ගියා. එතන එක ම ගාලගෝට්ටියක්.

"සියාතු මාමෙ, මොකෑ වෙලා තියෙන්නෙ"

මාමත් උදැල්ල කර තියාගෙන ඒ දිහාට දුවනවා.

"කවුදෝ මිනිහෙක් ව දවල් කෝච්චියට යටවෙලා. තක්කෙට ම සිහියක් නැතුව රේල් පාරෙන් පනින්ඩ ඇති. රා තොලේ ගාලා උන්න ද දන්නෑ. රේල් ගේට්ටුවක් තිබ්බත් වැඩක් නැනෙ කොල්ලො. ඒකත් දොරේ අඬේ ගාන යි. මහ එවුන්ට කොච්චර කීවත් උන් ඕවා හදන එකක් යැ.''

අනේ දෙයියනේ. සයිමන් සීයට පස්සෙ කෝච්චියට යට වුණු හත් වෙනි කෙනා. රේල් ගේට්ටුවත් අද හදනව හෙට හදනව කියුවට හැමදා ම ඔහොම ම යි. ළඟට එනකම් ම දන්නෙ නැනෙ ඉතින්. ඒත් මේ කෙනාට හෝන් සද්දෙ ඇහුණෙවත් නැතුව ද. මම දසුන් මල්ලිවත් ඇදගෙන ම හැප්පුණ කෙනා බලන්න ඉස්සරහට ගියා. වට වෙලා ඉන්න කට්ටිය අස්සෙන් මම එබිකම් කරල බැලුවා. රොත්තට මිනිස්සු පොර කනව. ළං වෙන්ඩ බෑ ඒ හරියට. මට මූණ පෙනුණෙ නෑ. මම යාන්තමට දැක්කා හොඳට තීන්ත පිරුණ අලුත් පෑන් දෙකක් එක්ක ඒ කෙනා අතේ දාහෙ නෝට්ටුවක් ගුලි කරලා තිබ්බා. කුච්තාන්සි තුන්ඩුවක් එක්ක ම මයෙ හිතේ.

මට ඒ කවුද කියල හරියට ම බලා ගන්ඩ ඕනෙ වුණා. සෙනඟ අස්සෙන් පොරකාගෙන මං ඇතුළට ම එබුණා. හරනල් කට්ටක් අමුණලා තිබ්ච්ච රතුපාට අඩිය ගෙවුණ බාට කැලි දෙකක්. ඒ දෙක මගේ ඇහැට හොඳට පුරුදු යි. මම තවත් මිනිස්සු අස්සෙන් පොරකාගෙන එබුණා. අප්පච්චි ආන්ත්‍රා වෙන්ඩ කලින් දවසෙ ඇඳන් උන්නු කමිසෙ වාගේ ම කමිසයක් ඇදගත්තු මනුස්සයෙක්. ලේ විලක් මැද්දේ. මම තවත් කාගෙන ඉස්සරහට ගියේ කොහොමින් කොහොම හරි මූණ බලා ගන්ඩ කියලා.

ලේ විල මැද්දේ ඒ හිටිය ඒ කෙනා ව දැක්කට පස්සෙ මට හැමදේ ම පෙනෙන්ඩ ගත්තේ බොඳ වෙලා. මයෙ කකුල් දෙක පණ නැතිවේගෙන ආවා. කන් දෙක පුපුරන්ඩ තරම්. එක පොරේට බෙරිහන් දිදී පොර කකා මිනිස්සු මං දිහාට එබීගෙන බලාන උන්නා. කවුරු මොනව කියනව ද කියලා නෑ. එක ම ගෝසාව. මීට කලියෙන් දැනුණෙ නැති පාළුවක්. ඒත් එක්ක ම ස්ටේසන් මාස්ටර් මා දිහාට එබුණා වගේ මට යාන්තමට මතක යි. සුදු පාට කබාය මගෙ ඇස්වලට හොඳට හුරු යි. ස්ටේසන් මාස්ටර් මාව උස්සන්ඩ හදනවා වගෙ දැනුණා.

එහෙනම් දැන් මට මගේ රචනාවට මාතෘකාවක් තියනවා.

සිහිය එනකොට මට තේරුණේ එච්චර යි.

9 772950 655005

නිමි.

ඩී.ජී. අකලංක පෙරේරා
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
swasthika.akalanka4@gmail.com

9 772950 655005